# තනතුරු පුරප්පාඩු

## කෘෂිකර්ම අමාත්‍යාංශය

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පවත්නා පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් කාර්යාල)

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය/ කළමනාකරණය/ රක්ෂණය/අලෙවිකරණය/වාණිජ්‍යය/ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂෙත්‍රයකින් ලබාගත් උපාධියක් හා උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය අංශයේ/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ආයතනයක වසර 03 ක ක්ෂෙත්‍ර හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද.

### සහකාර අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත්)

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ව්‍යාපාර පරිපාලනය/මානව සම්පත් කළමනාකරණය/කළමනාකරණය/නීතිය යන විෂය ක්ෂෙත්‍රයකින් ලබාගත් උපාධියක් හා උපාධිය ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය අංශයේ/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ආයතනයක වසර 03 ක පරිපාලන හා මානව සම්පත් කටයුතු පිළිබඳ පළපුරුද්ද.

### සහකාර අධ්‍යක්ෂ (මුදල්)

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ගිණුම්කරණය/ කළමනාකරණය/වාණිජ්‍යය/ ව්‍යාපාර කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය යන විෂය ක්ෂෙත්‍රයකින් ලබා ගත් උපාධියක් හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) ආවසරික සහතිකය හෝ මධ්‍ය පරීක්ෂණයෙන් සමත් සහතිකය/CIMA/ACCA හි වෘත්තීය I මට්ටමෙන් සමත් සහතිකය හෝ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකය සමඟ අදාළ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය අංශයේ/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ආයතනයක ගිණුම්කරණ/විගණන ක්ෂෙත්‍රයේ අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද.

### සහකාර අධ්‍යක්ෂ (නීති සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිවේදී උපාධිය (L.L.B) හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිඥ විභාගය සමග ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥයෙකු වශයෙන් වසර 03ක පළපුරුද්ද.

### සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂෙත්‍රයකින් ලබාගත් උපාධියක් හා උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය අංශයේ/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ආයතනයක වසර 03ක පරිගණක හා තොරතුරු තාක්ෂණ විෂය ක්ෂෙත්‍රයේ පළපුරුද්ද.

**i. වැටුප් පරිමාණය :**

2016.04.25 දිනැති අංක 02/2016 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛණ I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය MM 1-1 රු. 53,175 - 1375x10 - 1910x15 - 95,575/- (MM 1-1 - 2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛණ II හි සඳහන් පරිදි වේ.
(මීට අමතරව මණ්ඩලය විසින් අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.)

**ii. වයස් සීමාව :**

වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**iii. අතිරේක සුදුසුකම් :**

i. ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව

ii. පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් තිබීම.

<u>සංවර්ධන නිලධාරී</u>

**i. අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය/අලෙවිකරණය/රක්ෂණය/වාණිජ්‍යය/ ආර්ථික විද්‍යාව/ සංඛ්‍යාන විද්‍යාව යන විෂය ක්ෂෙත්‍රයකින් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

**ii. වැටුප් පරිමාණය :**

2016.04.25 දිනැති අංක 02/2016 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛණ I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය MA 3 රු. 32,200 - 445x10 - 660x11 - 730x10 -750x5 - 54,960/- (MA 3 - 2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛණ II හි සඳහන් පරිදි වේ.
(මීට අමතරව මණ්ඩලය විසින් අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.)

**iii. වයස් සීමාව :**

වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**iv. අතිරේක සුදුසුකම් :**

i. ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව

ii. පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් තිබීම.

කළමනාකරණ සහකාර

**i. අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :**

(අ) i. සිංහල / දෙමළ භාෂාව
ii. ගණිතය
ඇතුළුව
iii. තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් 03 කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**ii. වැටුප් පරිමාණය :**

2016.04.25 දිනැති අංක 02/2016 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛණ I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය MA 1-1 රු. 27,910 - 300x10 - 350x7 - 495x4 - 660x20 - 48,540/- (MA 1-1 - 2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛණ II හි සඳහන් පරිදි වේ.
(මීට අමතරව මණ්ඩලය විසින් අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.)

**iii. වයස් සීමාව :**

වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**වෙනත්:**

සෑම අපේක්ෂකයෙක්ම,

(අ). ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ඇ). තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ). විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**බඳවා ගන්නා ආකාරය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**සේවා කොන්දේසි :**

මෙම තනතුර ස්ථිරය. සේවා දායකයා විසින් වැටුපින් 10% ක් සහ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් 12% යන පදනම යටතේ සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවනු ඇත. මණ්ඩලය මගින් වැටුපින් 3%ක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ද දායකත්වය සලසනු ලැබේ.

දැනටමත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සංස්ථා වල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතු අතර, ඔවුන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. තවද අපේක්ෂකයා තෝරා ගනු ලැබුවහොත් මසක කාලයක් ඇතුළත ඔහු සේවයෙන් මුදාහැරිය හැකි බව එම ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

**අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය :**

නම, ලිපිනය, වයස, අධ්‍යාපනික සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් අයදුම්පත්, සහතිකවල පිටපත් සහ අයදුම්කරුගේ ඥාතීන් නොවන තොරතුරු දැන ගත හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් ද සහිතව 2023.03.09 වෙනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සහතික වල පිටපත් අමුණා නැති හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී තමන් අයදුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර එවිය යුතුය. බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

**සභාපති**
**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය,**
**අංක 117, සුභද්‍රාරාම පාර,**
**ගංගොඩවිල,**
**නුගේගොඩ.**
**2023.02.24**